සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

## දෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2017

## Second Term Test - Grade 7 - 2017

**නම : ............................................... පෙරදිග සංගීතය කාලය : පැය 02 යි.**

## I කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) සප්තකයක් තුල ඇති ස්වර දොළොසෙහි (12) 4 වෙනි සහ 11 වෙනි ස්වර වන්නේ ,
(i) ග, ධ සවරවේ (ii) ග, නි ස්වර වේ (iii) ම. නි ස්වර වේ (iv) ස, ප ස්වර වේ.

(2) තාලයේ කුඩාම ඒකකය වන්නේ,
(i) මාත්‍රා වේ. (ii) ඨේකාව වේ. (iii) විභාග වේ. (iv) ග්‍රහ වේ.

(3) දේශාභිමානී ගීතයක් වන්නේ,
(i) අහන්න මගේ හොඳ පුංචි පුතේ (ii) දූඩි කල මාතා පෙම්බර මාතා
(iii) ලෝකෙන් උතුම් රට ලංකාවයි. (iv) නොමග නොයන් පුතේ

(4) | x x x | x x x | මෙම තාලරූපයට ගැළපෙන ගීත පාදය වන්නේ
(i) දිය ගොඩ සැම තැන කිරි ඉතිරේ (ii) හිරු සඳු තරු මල්
(iii) ඉපදී බුදු වී (iv) රොනට වඩින

(5) උපදේශාත්මක ගීතයක් නොවන්නේ,
(i) පාන්කිරිත්තා තක්කිට තරිකිට (ii) නැති බැරි මොහොතට පිහිටට ඉන්නේ
(iii) වෙසක් කැකුළු අතු අග ඉද (iv) හිතන්නකො අයියේ දූන්වත්

(6) හින්දුස්ථානි සංගීතයේ ආභාසය ලබා පෝෂණය වූවකි,
(i) කෝලම් ගී. (ii) ළමා ගී. (iii) නුර්ති ගී. (iv) නාඩගම් ගී.

(7) කෝමල ස්වර ස්ථාපන ගී ඇසුරෙන් නිර්මාණය වු ස්වර අභ්‍යාසයකි
(i) සස රිරි ගග මම පප ධධ නිනි ස̇ස̇
(ii) සස රිරි <u>ග</u> <u>ග</u> මම පප ධධ <u>නි</u> <u>නි</u> ස̇ස̇
(iii) සස රිරි ගග ම́ම́,පප ධධ නිනි ස̇ස̇
(iv) සස රිරි ගග මම́ පප ධධ නි නි ස̇ස̇

(8) ගැමි ගී යටතේ සමාජයීය ගී වර්ගයකි.
(i) කෝළම් ගී. (ii) නුර්ති ගී. (iii) දරුනැළිවිලි ගී. (iv) සරල ගී.

(9) සප්තයෙහි අචල ස්වර වන්නේ
(i) ග,ධ ස්වර වේ. (ii) රි,ප ස්වර වේ. (iii) ම,ස ස්වර වේ. (iv) ස,ප ස්වර වේ

(10) |දො - - |ජි - ත| මෙම බෙර පදයේ හිස්තැන්වලට සුදුසු අක්ෂර වන්නේ පිළිවෙලින්,
(i) ං,ජි,ග (ii) ග,ජි,ං (iii) ජි,ග,ං (iv) ජි.ං.ග

v **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රශ්නවලට වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

( තබ්ලාව , වයලීනය , දාදරා හාර්මොනියම්, ගැටබෙරය, ත්‍රිතාල් )

(11) ස්වර පුවරුව (කී බෝඩ්) සහිත භාණ්ඩයකි ................................................

(12) ........................................ තත් සහිත භාණ්ඩයකි.

(13) මාත්‍රා 3න් 3 විභාග වන හිංදුස්ථානි තාලය ......................................... වේ.

(14) දොං,දොම් කිට වැනි අක්ෂර සහිත තාල පද වයන්නේ .............................. යෙනි

(15) ධා, ධිං, න අක්ෂර සහිත තාලය වාදනය කරනු ලබන සංගීත භාණ්ඩය ..................................... වේ

v **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ඇති ප්‍රකාශ හරි නම් 3 ලකුණද වැරදි නම් 8 ලකුණද යොදන්න.**

(16) ගැමී ගී මුඛපරම්පරාවෙන් පැවතගෙන එන ගී වර්ගයකි. ( )

(17) ගීතය අනුවම වාදනය කිරීම ගී අනුවාදනය වේ. ( )

(18) නොමග නොයන් පුතේ මෙම ගී පාදය උපදේශාත්මක ගීතයක් නොවේ. ( )


(19) රබන් වාදනයේ ක්‍රම දෙකකි. බංකු රබන් හා අත් රබන් ( )

(20) කටු අකුලේ මල් ඇහැරේ දේශාභිමානි ගීතයක පාදයකි. ( )

( ලකුණු 1 බැගින් 20)

## II කොටස

v **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 3කට පිළිතුරු සපයන්න.**



A B C D

(1) ඉහත දක්වෙන රූප සටහන් ආශ්‍රයෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(i) A B C D අක්ෂර වලින් දක්වෙන සංගීත භාණ්ඩ නිවැරදිව නම් කරන්න.

(ii) A භාණ්ඩයේ කොටස් දෙක නම් කරන්න.

(iii) B සංගීත භාණ්ඩයේ වාදනය කරන ක්‍රමය වර්ගදෙකකි. (පෙරදිග ක්‍රමයට නම් කරන්න)

(iv) D සංගීත භාණ්ඩයට සමාන වන (ස්වර පුවරුව සහිත) භාණ්ඩ දෙකක් ලියන්න. ( ලකුණු 10 )

(2) (i) ඔබ ඉගෙන ගත් කෝමල <u>ග</u> <u>නි</u> ස්වර ස්ථාපන ගීතයක් ගීත ස්වර සමග ප්‍රස්තාර කරන්න.

(ii) කෝමළ ග නි ස්වර ඇසුරෙන් සවර අභ්‍යාසයක් ආරෝහණ ක්‍රමයට උච්ච සඩ්ජය දක්වා ලියන්න.

( ලකුණු 10 )

(3) හද,උදුසන,අම්මා,සුරතල් කිටියා ,වැස්ස යන මාතෘකාවලින් එකක් තෝරාගෙන ගී පදමාලාවක් නිර්මාණය කරන්න. (පද පේළි 4ක් ප්‍රමාණවත් වේ ) ( ලකුණු 10 )

(4) (i) තාලය වාදනය කල හැකි අවනද්ධ වාද භාණ්ඩ 4ක් නම් කරන්න.

(ii) තාලයේ වේගය කුමක් ලෙස හැඳින්වන්නේද?

(iii) එහි ප්‍රභේද නම් කරන්න.

(iv) එම ප්‍රභේද කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 10 )

(5) (i) සප්තකයක් තුල ඇති ස්වර 12 ආරෝහණ පිළිවෙලින් ලියන්න.

(ii) රබන් ගීයක් හෝ දරු නැළවිලි ගීයක් ලියන්න.

(iii) එම ගී වර්ගය පිළිබඳ විශේෂිත කරුණු 3ක් ලියන්න. ( ලකුණු 10 )

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 7 - 2017

### පෙරදිග සංගීතය පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | |
|---|---|---|---|
| 1. - (ii) | 6. - (iii) | 11. - හාර්මෝනියම් මෙලෝඩිකා ආදිය | 16 - 4 |
| 2 - (i) | 7. - (ii) | 12 - වයලීනය | 17 - 4 |
| 3 - (iii) | 8. - (iii) | 13 - දාදරා | 18 - 5 |
| 4 - (iv) | 9. - (iv) | 14 - ගැටබෙරය | 19 - 4 |
| 5 - (iii) | 10. - (i) | 15 - තබ්ලාව | 20 - 5 |

(ලකුණු 1 x 20 = 20 )

## II කොටස

(1) (i) A = තබ්ලාව
C = බටනලාව
B = ගැටබෙරය
D = සර්පිනාව ( හර්මෝනියම්)

(ii) දායාබ - බායාව ( දහිනා - බාංයා )

(iii) මුරලි - බංසුරි

(iv) මෙලෝඩිකා, පියානෝව, එකෝඩියන් ........ ආදී භාණ්ඩ ( ලකුණු 10 )

(2) (i) ලකුණු - 06
(ii) ලකුණු - <u>04</u>
<u>10</u>

(3) ලකුණු - 10

(4) (i) ලකුණු - 02
(ii) ලකුණු - 01
(iii)ලකුණු - 03
(iv)ලකුණු - <u>04</u>
<u>10</u>

(5) (i) ලකුණු - 04
(ii) ලකුණු - 03
(iii)ලකුණු - <u>03</u>
<u>10</u>